# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
## அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி:(94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்:(94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்:dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: www.pubad.gov.lk Web Site


---

මගේ අංකය / எனது இல / My No: COM/TRANS/V/වාස්මා-2022

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி: / Date: 2022.01.26

සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ඒකාබද්ධ සේවයේ වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත කරන ලද අභියාචනා සම්බන්ධ තීරණ - 2022**

ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත ඒකාබද්ධ සේවයේ නිලධරයන් විසින්, 2022 වාර්ෂික ස්ථාන මාරු යෝජනා පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ www.psc.gov.lk වෙබ් අඩවියේ පළ කර ඇත.

02. ඒ අනුව 2022 වාර්ෂික ස්ථාන මාරු ලේඛනයේ, සමාලෝචන කමිටු තීරණවල හා අභියාචනා සම්බන්ධයෙන් දෙන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණවල, ක්‍රියාත්මක විය යුතු දිනය විශේෂයෙන් සඳහන් කර නොමැති ස්ථාන මාරුවීම් 2022.02.01 දින සිට ක්‍රියාත්මක වේ.

03. තවද ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වීම සඳහා 2022.02.01 දිනට පසු වෙනත් නිශ්චිත දිනයක් සඳහන් කර ඇති ස්ථාන මාරුවීම් එම නිශ්චිත දින සිටම අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු බවද වැඩි දුරටත් දන්වා සිටිමි.

04. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අදාළ නිලධරයාට දන්වා ඒ අනුව ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරන ලෙස කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු.දැ.ගැ.ස.